www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව එල්ටීටීඊය සමග කොන්දේසි විරහිත සාකච්ඡා ප්‍රතික්ෂේප කරයි

## Sri Lankan government rejects unconditional peace talks with the LTTE

සරත් කුමාර විසිනි
2006 සැප්තැම්බර් 15

ශ්‍රී ලංකාවට ආධාර දෙන කන්ඩායමේ සමසභාපතිවරුන් සාම සාකච්ඡා පිලිබඳව අඟහරුවාදා කල නිවේදනයට කොලඹ ආන්ඩුව දැක්වූ ප්‍රතිචාරයෙන් පැහැදිලි වන්නේ එය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාකච්ඡා පැවැත්වීම ගැන කිසිදු උනන්දුවක් නොදක්වන බව හා යුද්ධය ගෙන යාම එහි අභිප්‍රාය වන බව ය.

ශ්‍රී ලංකාවේ ඊනියා සාම ක්‍රියා දාමය තථ්‍ය වසයෙන් අධීක්ෂනය කරන සමසභාපතිවරු (එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ) නිල නිවේදනයක් නිකුත් කරමින් කොන්දේසි විරහිතව සාකච්ඡාවලට සහභාගි වීමට දෙපාර්ශ්වය දක්වන කැමැත්ත සාදරයෙන් පිලිගත් අතර, සියලු ප්‍රචන්ඩ ක්‍රියා වහා නතර කොට ඔක්තෝබර් මස මුල ඔස්ලෝහි දී හදිසි සාකච්ඡාවලට එලඹෙන ලෙස ඉල්ලා සිටියහ. 2002 සටන් විරාමය "හිතාමතා ම උල්ලංඝනය කිරීම" ගැන ගැඹුරු නොසන්සුන්තාව ප්‍රකාශයට පත් කල එම නිවේදනය, ලමුන් විශාල සංඛ්‍යාවක මරනයට හේතු වෙමින් අගෝස්තු මාසයේ දී පාසලකට එල්ල කල ගුවන් හමුදා බෝම්බ ප්‍රහාරය ඇතුලු මිලේච්ඡ ක්‍රියාවන් ගනනාවක් ම උපුටා දැක්වී ය.

මිලිටරිය හා එහි පැරා-මිලිටරි සගයන් එල්ටීටීඊයට වල කැපීමේ හා එය ප්‍රකෝප කිරීමේ එල්ලයෙන් යුතුව ප්‍රචන්ඩ ක්‍රියාවල හා ඝාතනවල නිරත වෙද්දී පවා, පසු ගිය නොවැම්බරයෙහි තේරී පත් වූ දා පටන් ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් "සාම දූතයෙකු" බව පෙන්නුම් කිරීමට උත්සාහ දරා තිබේ. පසු ගිය ජුලි මස දී ඔහු "මානුෂික හේතු" උදෙසා එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල පිහිටි මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමට විශාල පරිමානයේ මිලිටරි ආක්‍රමනයක් දියත් කලේ ය. සාම්පූර්හි හා යාපන අර්ධද්වීපයෙහි එල්ටීටීඊ මධ්‍යස්ථාන අල්ලා ගැනීමට හමුදාව තව දුරටත් ප්‍රහාරක මෙහෙයුම් දියත් කරද්දී, සිය ක්‍රියා මාර්ග හුදෙක් ම "ආරක්ෂක" පියවර යැයි ආන්ඩුව අවධාරනය කල අතර සාම සාකච්ඡා පැවැත්වීමේ සිය සූදානම රාජපක්ෂ යලිත් අවධාරනය කලේ ය.

දැන් එම සාකච්ඡා න්‍යාය පත්‍රයට ඇතුලු වී ඇති නමුත් රාජපක්ෂ ආන්ඩුව කිසිදු සාකච්ඡාවක් නොපැවැත්වෙන බව සහතික කර ගැනීමේ එල්ලයෙන් යුතුව විරෝධතා, තහංචි හා අවසන් නිවේදන මාලාවක් ම මතු කර තිබේ. සමසභාපතිවරුන්ගේ නිවේදනයෙන් පසුව අඟහරුවාදා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී "කොන්දේසි විරහිත සාකච්ඡා" සඳහා පවත්නා ඉඩකඩ ක්ෂනිකව බැහැර කල ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල, ජාත්‍යන්තර ප්‍රජාව නොමග යවන බවට නෝර්වේජියානු පහසුකම් සපයන්නාට චෝදනාවන් ද එල්ල කලේ ය.

රාජපක්ෂ නෝර්වේජියානු නියෝජිත එරික් සොල්හෙයිම්ට කියා ඇත්තේ, ආන්ඩුව "කොන්දේසි විරහිතව" සාකච්ඡා පැවැත්වීමට සූදානම් නමුත් පලාලි මිලිටරි සංකීර්නයට හා ගුවන් හමුදා කඳවුරට එල්ටීටීඊ තුවක්කු මගින් එල්ල වන තර්ජනය "නිෂ්ක්‍රිය" කරන පියවර ගැනීමෙහි මිලිටරිය දිගට ම නිරත වන බව යැයි රඹුක්වැල්ල පැවසී ය. "ශ්‍රී ලංකාව

ස්වෛරී රටක්" වන බැවින් සාකච්ඡාවල දිනය හා ස්ථානය තීන්දු කිරීමේ කිසිදු අයිතියක් සොල්හෙයිම්ට නැතැයි ප්‍රකාශ කරමින් ඔහු යෝජිත රැස්වීමට ද විරුද්ධත්වය පල කලේ ය.

බදාදා ආන්ඩුවේ සාම මහ ලේකම් කාර්යාලය තව දුරටත් බාධක එක් කරමින් නිල ප්‍රතිචාරයක් නිකුත් කලේ ය. මිලිටරි ක්‍රියා මාර්ග ගැනීමේ අයිතිය ආන්ඩුව අත තව දුරටත් තබා ගන්නා බව දැනට මත් අවධාරනය කර ඇති තතු යටතේ, එම නිවේදනය "එදිරිවාදීකම් මුලුමනින් ම හා සනාථ කර ගත හැකි ලෙස නතර කරන බවට එල්ටීටීඊ නායකයාගෙන් පැහැදිලි පොරොන්දුවක්" ඉල්ලා සිටියේ ය. වෙනත් වචනවලින් කියතොත් හමුදාව සිය "ආරක්ෂක" ක්‍රියා මාර්ග දිගට ම ගෙන යන අතර ඒවාට ප්‍රතිචාර නොදක්වන බවට එල්ටීටීඊය ලිඛිත පොරොන්දුවකින් බැඳී සිටිය යුතු ය.

සාවද්‍ය නමකින් හැඳින්වෙන මෙම සාම මහ ලේකම් කාර්යාලය කිසිදු සාකච්ඡාවක් සමාන කොන්දේසි යටතේ නො පැවැත්විය යුතු බව ද විශේෂයෙන් ම සඳහන් කලේ ය. "ශ්‍රී ලංකාවේ සාම ක්‍රියා දාමය සිදු වන්නේ ස්වෛරී රාජ්‍යයක ප්‍රජාතාන්ත්‍රිකව තේරී පත් වූ ආන්ඩුවක් සහ ත්‍රස්තවාදය භාවිත කරන සන්නද්ධ කන්ඩායමක් අතර ය යන කරුන" "සටහන් කර ගැනීම වැදගත් යැ"යි නිවේදනය ප්‍රකාශ කරයි. මෙම විරුද්ධවාචකය 2002 සටන් විරාමය අත්සන් කිරීමෙන් පසුව එකඟ වූ සාම ක්‍රියා දාමයේ පදනමට තථ්‍ය වසයෙන් වල කපයි.

නිවේදනය, "එල්ටීටීඊය නීති විරෝධී ලෙස අවි මිලට ගැනීම වැලැක්වීමේ ප්‍රායෝගික යන්ත්‍රනයක් ද එය ආයුධ ලබා ගැනීමට එරෙහි තථ්‍ය සම්බාධකයක් ද ක්‍රියාවට නංවන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවෙන්" ඉල්ලා සිටියේ ය. සැබවින් ම ආන්ඩුවේ පාර්ශ්වයෙන් ආයුධ මිලට ගැනීම් සහ මිලිටරිය ගොඩ නැගීමේ වැඩ කටයුතු නතර කිරීමක් අවශ්‍ය නොවනු ඇත.

"බරපතල ලෙස නොමග යවනසුලු ප්‍රකාශයක් වන මුලතිව්හි පාසලකට බෝම්බ දැමීමේ චෝදනාව වැනි" සමසභාපතිවරුන්ගේ නිවේදනය තුල පැවති "දත්තමය වසයෙන් සාවද්‍ය කරුනු" පිලිබඳව සාම මහ ලේකම් කාර්යාලය සිය "බලවත් කනගාටුව" ප්‍රකාශ කලේ ය. යුනිසෙෆ් සංවිධානය සහ ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) යන දෙගොල්ල ම අගෝස්තු 14 දා බෝම්බ ප්‍රහාරය එල්ල වූ ස්ථානය නැරඹීමට ගිය අතර ප්‍රහාරයට ගොදුරු වූවන් ආන්ඩුව කියා පාන පරිදි "ලමා සොල්දාදුවන්" නො ව පාසල් ශිෂ්‍යයන් බව ඔවුහු තහවුරු කලහ.

ආන්ඩුව 2002 සටන් විරාමයේ කොන්දේසිවලට එකඟ විය යුතු බවටත් පසු ගිය මාස දෙක තුල දී අල්ලා ගත් භූමි ප්‍රදේශවලින් ඉවත් විය යුතු බවටත් අවධාරනය කර ඇති එල්ටීටීඊයේ පාර්ශ්වයෙන් ගත් විට, තමන් ඉදිරිපත් කරන එවන් කොන්දේසි කෙරෙහි දක්වන කවර හෝ එකඟත්වයක් යනු මූලික පසුබැසීමක් වන බව ආන්ඩුව හොඳින් දනී. සාම මහ ලේකම් කාර්යාල නිවේදනයේ යුදකාමී තානය පිලිබිඹු කරන්නේ කොලඹ පාලක කව තුල දිගට ම පවත්නා යුද සෝෂාව යි.

සාම මහ ලේකම් කාර්යාලය සිය නිවේදනය නිකුත් කල දිනය ම ඉලක්ක කොට, ජනාධිපති රාජපක්ෂ වත්මන් ආරක්ෂක තත්වය පිලිබඳව "නිල නොවන සාකච්ඡා" පවත්වනු වස් සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායකයන් හමු විය. සිනා සෙමින් ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ වැලඳ ගෙන සිටින රාජපක්ෂගේ ඡායාරූපයක් කොලඹ පුවත්පත්වල ප්‍රමුඛ ලෙස පල කොට තිබුනි. රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග නිල සන්ධානයක් ඇති කර ගැනීම පිලිබඳව ගෙන යන වත්මන් සාකච්ඡාවල දී ජවිපෙ ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කර ඇති අතර 2002 සටන් විරාමය වහා ම අහෝසි කිරීම ඇතුලු එම ඉල්ලීම් යුද ප්‍රකාශ කිරීමකට සමාන ය.

බදාදා, සමසභාපතිවරුන්ගේ නිවේදනයට එරෙහිව එල්ල කල ප්‍රසිද්ධ වාග් ප්‍රහාරයක දී ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ ආන්ඩුවේ ප්‍රතිචාරයේ සැබෑ අන්තර්ගතය

වැමැරුවේ ය. "කොටින්ට එරෙහිව දැන් ගෙන යන මිලිටරි ප්‍රහාර නතර නො කරන" ලෙසත් "කොටි අවි බිම තබන තෙක් එල්ටීටීඊය සමග කිසිදු සාකච්ඡාවක් නො පවත්වන" ලෙසත් ඔහු ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. වෙනත් වචනවලින් කියතොත්, එල්ටීටීඊයේ පූර්න යටත් වීමෙන් මෙපිට කිසිවක් භාර ගනු නො ලැබේ.

එල්ටීටීඊය ගලවා ගැනීමට මැදිහත් වන්නේ යැයි වීරවංශ සමසභාපතිවරුන් හෙලා දුටුවේ ය. "කොටින් කරදරයට පත්ව සිටින ඕනෑ ම අවස්ථාවක ජාත්‍යන්තර ප්‍රජාව ලෙස තමන් හඳුන්වා ගන්නා මේ මිනිස්සු ඔවුන් ගලවා ගැනීමට පැමිනෙනවා" යැයි ප්‍රකාශ කල ඔහු, රැස්වීමක් පැවැත්වෙන වේලාව හා ස්ථානය සම්බන්ධයෙන් ආන්ඩුවේ අදහස් විමසීමට අපොහොසත් වීම ගැන සමසභාපතිවරුන් විවේචනය කලේ ය. "අපේ රටට ඇඟිලි ගැසීමට ඔවුන්ට කිසිදු අයිතියක් නැතැ"යි වීරවංශ පැවසී ය.

වීරවංශගේ ප්‍රකාශ ආන්ඩුව හා මිලිටරි කව තුල සිටින්නන් සිතන ආකාරය පෙන්නුම් කරයි. එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීමෙහි ලා හමුදාව අත්පත් කර ගෙන ඇති ආරම්භක සුලු සාර්ථකත්වයන් මගින්, රටේ දිග් ගැසුනු ලේ වැකි යුද්ධය මිලිටරි විධික්‍රම මගින් අවසානයකට ගෙන ආ හැකි ය යන මිථ්‍යාව යලිත් වතාවක් දිරි ගැන්වෙයි. ආන්ඩුවට ජාත්‍යන්තර ප්‍රජාව වෙතින් අවශ්‍ය වන්නේ සාම සාකච්ඡා නො ව එල්ටීටීඊයේ මිලිටරි හැකියාවන් විනාශ කොට දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ පුරා දෙමල සුලුතරය මත ආන්ඩුවේ අනභියෝගී පාලනය පැටවීම පිනිස වන සහයෝගය යි.

රාජපක්ෂ හේතු දෙකක් නිසා ජවිපෙ මනෝගතීන් විවෘතව ම ප්‍රකාශයට පත් නො කරයි. පලමු කාරනය නම්, පසු ගිය දශක දෙක මුලුල්ලේ අඩු ගනනේ ජීවිත 65,000ක් පමන බිලි ගෙන ඇති යුද්ධය කරා රට යලි ඇද වැටීම සම්බන්ධයෙන් පුලුල්ව පැතිර පවත්නා භීතීන් හා මහජන විරුද්ධත්වය ගැන ජනාධිපති හොඳින් දැන සිටීම යි. දෙවන කාරනය නම්, පක්ෂපාතී වීම ගැන සමසභාපතිවරුන්ට ප්‍රසිද්ධියේ චෝදනා එල්ල කරන නමුත් තම ආන්ඩුවට මහ බලවතුන්ගේ විශේෂයෙන් ම එක්සත් ජනපදයේ දේශපාලන සහයෝගය අවශ්‍ය බව රාජපක්ෂ දැන සිටීම යි.

දෙපාර්ශ්වයට ම එක සේ සලකන බවක් පෙන්නුම් කිරීමට දරන සියලු ප්‍රයත්නයන් තිබිය දී ම, රාජපක්ෂ වඩ වඩා විවෘතව ම යුද්ධයේ සරන සොයා යාම නො තකා පසු ගිය මාස 10ක කාලය තිස්සේ ම සමසභාපතිවරුන් ඔහු පිටුපස පෙල ගැසී සිට ඇත. ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලා දකින අතර, "හික්මීමක් පෙන්නුම් කරන" බව කියමින් මහ බලවතුන් ආන්ඩුවට ප්‍රශංසා කර තිබේ. විශේෂයෙන් ම බුෂ් පාලනාධිකාරය, එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස තහනම් කිරීමට කැනඩාවට හා යුරෝපා සංගමයට බල කරමින් ලොව වටා දෙමල විදේශගත ප්‍රජාව අතර එල්ටීටීඊයට පවත්නා මූල්‍යමය හා දේශපාලනික සහයෝගී මූලාශ්‍රයන් හිර කිරීමේ රාජ්‍ය තාන්ත්‍රික ව්‍යාපාරයක් ගෙන ගොස් ඇත.

අගහරුවාදා සමසභාපතිවරුන්ගේ නිවේදනය යලිත් වතාවක් එල්ටීටීඊය මත වගකීම පටවා ඇත්තේ එය "ත්‍රස්තවාදය හා ප්‍රචන්ඩත්වය අත හැර" "එක්සත් ශ්‍රී ලංකාවක් තුල දේශපාලන විසඳුමක් සඳහා අවශ්‍ය සම්මුතිය ඇති කර ගැනීමට තමන් කැමැත්තෙන් සිටින බව පෙන්විය" යුතු යැයි ඉල්ලා සිටිමිනි. මාවිල්ආරුහි, සාම්පූර්හි හා යාපන අර්ධද්වීපයේ මුහමලෙයි එල්ටීටීඊ ඉදිරි ආරක්ෂක වලල්ලෙහි පිහිටි එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගනිමින් රාජපක්ෂ සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කිරීම ගැන එයට කිසිවක් කීමට තිබුනේ නැත. හමුදාවේ එල්ලය වන්නේ ඔවුන්ට ප්‍රථම වතාවට 2000 දී අහිමි වූ යාපනයට ඇතුලු වන මූලෝපායික ස්ථානය වන අලිමංකඩ යලි අල්ලා ගැනීම ය යන්න වඩ වඩා පැහැදිලි වෙමින් පවතී.

එක්සත් ජනපදය පාදක කොට ගත් චින්තන පර්ෂදයක් වන ස්ට්‍රැට්ෆෝර් ආයතනයට ආන්ඩුවේ මූලෝපාය ගැන කිසිදු සැකයක් නැත. නැගෙනහිර පලාතේ දී එල්ටීටීඊයට

එරෙහිව ගෙන ගිය මෙහෙයුම් ගැන සඳහන් කිරීමෙන් පසුව, "ශ්‍රී ලංකාවේ පවත්නා හිර වීම" යන මැයෙන් යුත් එහි ලිපිය මෙසේ පවසයිඃ "ශ්‍රී ලංකාවේ ආන්ඩුව ලේ සුවඳ විඳ දැන් උත්සාහ දරන්නේ, අලිමංකඩ හා මුහමලෙයි නගරය වැනි දැන් කොටින්ගේ ග්‍රහනයේ ඇති, යාපනය සමග වන සියලු ප්‍රවාහන සම්බන්ධතා මාර්ග සුරක්ෂිත කර ගැනීමේ ඉඩකඩ තමන්ට ලබා දෙන මධ්‍යස්ථාන අල්ලා ගැනීමට සහ කැරලිකරුවන් උතුරු ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ සාම්ප්‍රදායික පදනම් කරා තව දුරටත් තල්ලු කර දැමීමට යි."

එල්ටීටීඊයේ ප්‍රතිචාරය ඔවුන්ගේ දේශපාලන ධ්වජභංගය හා බංකොලොත්කම යලිත් වතාවක් එලිදරව් කර තිබේ. යුද්ධයේ අන්තරායයන් ගැන අනතුරු ඇඟවූ එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක එස්.පී. තමිල්චෙල්වම්, "සටන් විරාම ගිවිසුමේ සඳහන් භූමි ප්‍රදේශ වෙන් කරන සීමාවන්, වගන්ති හා කොන්දේසිවලට රාජපක්ෂ ආන්ඩුව බැඳී සිටින බව සහතික කරන ලෙසත් එමගින් සාකච්ඡා සඳහා හිතකර වාතාවරනයක් නිර්මානය කරන ලෙසත් ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචන කලේ ය. සාම සාකච්ඡාවල දී දිගින් දිගට ම ඔවුන්ගේ ඉදිරි දර්ශනය වී ඇත්තේ දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කරනු පිනිස සිංහල හා දෙමල පාලක ප්‍රභූන් අතර බලය බෙදා ගැනීමේ සැකැස්මක් ඇති කර ගැනීම යි.

කෙසේ වෙතත් රාජපක්ෂ ආන්ඩුව කටයුතු කරන්නේ මහ බලවතුන්ගේ වක්‍ර පිටුබලය ද සහිතව සාම ක්‍රියා දාමයට තථ්‍ය වසයෙන් වල කපා ශ්‍රී ලංකා රාජ්‍යය මත සිංහල ධනේශ්වරයේ ආධිපත්‍යය සහතික කර ගැනීමේ වර්ගවාදී යුද්ධයක් තුලට දිවයින යලි ඇද දැමීමේ අභිප්‍රායෙන් යුතුව ය.

© www.wsws.org